# ICCP/SL/OP/115

## ළමා අපයෝජනවලට ගොදුරුවීමේ ප්‍රාදේශීය ප්‍රවණතා සහ ප්‍රතිචාර ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයක් (බකමූණ පොලිස් බල ප්‍රදේශය ආශ්‍රයෙන්)

තෙන්නකෝන් ජේ. එම්. ඩී. එන්. [1*]

[1] අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
danukathennakon@gmail.com

**පසුබිම :** නෛතික අර්ථ දැක්විම තුළ වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකුම 'ළමයා' යනුවෙන් අදහස් වන අතර, ඔවුන් ආරක්ෂා කිරිම ඉලක්ක කොට ගෙන ළමයාට හිමිවිය යුතු සියලු ම තත්ත්වයන් ළමා අයිතිවාසිකම්' යනුවෙන් අදහස් කෙරේ. ළමා අපයෝජන හරහා මෙම ළමා අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය වේ. මේ සම්බන්ධව රැස් කොට ඇති දැනුම් සම්භාරය අතිමහත් නමුත්, දිවයිනේ ප්‍රදේශීය වශයෙන් බලපවත්නා තත්ත්වයන් ආශ්‍රිත පර්යේෂණයන්හි සාපේක්ෂ අඩු බවක් හඳුනාගත හැකිය. එබැවින් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය වශයෙන් පවත්නා ළමා අපයෝජන සිද්ධීන්ගේ මෑතකාලීන ප්‍රවණතා සහ ඒ ආශ්‍රිත නෛතික තත්ත්වයන් අධ්‍යයනය කිරීමයි.

**ක්‍රමවේදය :** මිශ්‍ර පර්යේෂණ සැලැස්මක් අනුගමනය කළ මෙම පර්යේෂණයේ නියැදිය ලෙස 2018 සිට 2024 දක්වා පොළොන්නරුව බකමූණ පොලිස් බල ප්‍රදේශය තුළ වාර්තා වූ ළමා අපයෝජන සිද්ධීන් යොදා ගෙන තිබේ. එහිදී ප්‍රාථමික දත්ත ලබා ගැනීමට බකමූණ පොලීසියේ ළමා හා කාන්තා අංශයේ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදුකළ අතර, ද්විතියික මූලාශ්‍ර ලෙස එම පොලීසියට වාර්තා වූ ළමා අපයෝජන සහ ඒ සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග පිළිබඳ පොලිස් වාර්තා යොදා ගෙන තිබේ. දත්ත විශ්ලේෂණයට Microsoft Excel මෘදුකාංගය සහ තේමාත්මක විශ්ලේෂණය යොදාගන්නා ලදි.

**ප්‍රතිඵල :** අධ්‍යයනයෙන් හඳුනාගත් පරිදි අදාළ කාලසීමාව තුළ ළමා අපයෝජන සිදුවීම් 82 ක් වාර්තා වී ඇති අතර, ඒ යටතට බල අපරාධ 45 ක් සහ සුළු අපරාධ 37 ක් අන්තර්ගත වේ. අදාළ කාලසීමාව තුළ වැඩි වශයෙන් වාර්තා වී ඇත්තේ ලිංගික අතවර සිදුකිරීම සහ වයස අවුරුදු 16 ට අඩු දැරියන් දූෂණය යන සිද්ධීන් ය. තවද හිංසිතභාවයට පත්වූ ළමුන් බහුතරය අවුරුදු 10-15 බව හඳුනාගත හැකිවිය. වාර්තා වූ සියලුම අපයෝජන සිදුවීම් වලට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති නමුත්, සිදුවීම් 46 කම අදාළ නඩු කටයුතු අවසන් වී නොමැති බව හඳුනාගත හැකිවිය.

**නිගමන :** මෙකී පර්යේෂණ ප්‍රතිඵල මත නිගමනය කළ හැක්කේ ළමා අපයෝජනයේ අනෙකුත් ප්‍රභේදයන්ට වඩා මෙම ප්‍රදේශයේ ළමා ලිංගික අපයෝජන සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් පවතින බවයි. යෞවනෝදයට සමගාමීව ළමුන්ට ලිංගික අවබෝධය ලබාදීමේ බලවත් අවශ්‍යතාව නිවාරණය විෂයයෙහි වැදගත් වන අතර, අධිකරණ නඩු කටයුතු වල ප්‍රමාදය තුළින් ළමයාගේ අනාගතයට එල්ලවන අනර්ථකාරී බලපෑම ඉවත් කිරීමට ස්ථිරසාර නෛතික ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව ද යෝජනා කෙරේ.

**මුඛ්‍ය පද:** ප්‍රතිචාර ක්‍රියාමාර්ග, ප්‍රදේශීය ප්‍රවණතා, නෛතික තත්ත්වය, ළමා අයිතිවාසිකම්, ළමා ලිංගික අපයෝජන.